# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට මෙන්ම ආසියා පැසිපික් කලාපයේ ප්‍රමුඛ පෙළේ දැවැන්ත බැංකු 500 අතරට ශ්‍රේණිගතව ඇති සහ ශ්‍රී ලංකාව තුළ රජයට අයත් අංක 1 අග්‍රගණ්‍ය බැංකුව වන ලංකා බැංකුව, යෝග්‍ය සුදුසුකම් ඇති උද්යෝගිමත් සහ ප්‍රතිඵල හඹායන තරුණ තරුණියන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී විගණන සහකාර

### යෝග්‍යතා නිර්ණායක

- **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**
- **සුදුසුකම් සහ පළපුරුද්ද**
  - අ.පො.ස (සා/ පෙළ) විභාගයේදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ 3 ක් සහිතව විෂයයන් හයකින් එකවර සමත් වී තිබීම.

    **සහ**
  - අ.පො.ස (උ/පෙළ) විභාගයේදී සාමාන්‍ය සාමාර්ථ 3 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) එකවර සමත් වී තිබීම.

    **සහ**
  - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි (ICASL) සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරිවරයෙකු වීම.

    **සහ**
  - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයෙහි (ICASL) අනුමැතිය ලත් විගණන සමාගමක හෝ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනයක වසර 02 ක සේවා පළපුරුද්ද.
  - ❖ ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL), CBF/IABF විභාගය සමත් වූවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
- **වෙනත් සුදුසුකම්**
  - ඉංග්‍රීසි බසින් සහ සිංහල හෝ දෙමළ බසින් සන්නිවේදන කුසලතා තිබීම.
  - අවම අධීක්ෂණයක් යටතේ ස්වාධීනව සේවය කිරීමේ හැකියාව.
  - පරිගණක සාක්ෂරතාව හා තොරතුරු තාක්ෂණය පදනම් වූ විගණන ශිල්ප ක්‍රම.
  - කණ්ඩායම් සාමාජිකයකු ලෙස සේවය කිරීමේ හැකියාව සමග අන්තර් පුද්ගල කුසලතා.
  - පීඩනයන් යටතේ සඵලතාවයෙන් යුතුව කාර්යයෙහි නියැලීමේ හැකියාව.
- **වයස**
  - ■ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයට අවුරුදු 26 හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් සහ කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් (02) වන අතර, එම කාලසීමාව තුළ (පළමු වසර සඳහා මසකට රු. 45,000/= ක් ද, දෙවන වසර සඳහා මසකට රු. 60,000/= ක් ද) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයෙන් පරිබාහිර වේ. (සංවෘත සේවය)
- පුහුණු කාලය තුළදී බැංකුව විසින් අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා සපුරාලීම මත විගණන සහකාර - 1 ශ්‍රේණියේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කෙරේ.
- බැංකුවේ අවශ්‍යතාවය අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.
- කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත/ නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.
- කෙටි දැනුම් දීමකින් අනතුරුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ගමන් කිරීමට හැකි විය යුතුය.

### තෝරාගැනීමේ පටිපාටිය

- ■ තරඟ විභාගයකින් අනතුරුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.
- ■ තරඟ විභාගයේදී ලබාගත් ලකුණු, සම්මුඛ පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් කෙටි ලැයිස්තුගත කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබේ.
- ■ තෝරාගැනීම පළාත් වශයෙන් හෝ බැංකුවේ අභිමතය පරිදි සිදු කරනු ලැබේ.

## අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk තුළින් ("Careers" තීරය හරහා) ලබාගත හැකි ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව සැකසූ ඔබගේ අයදුම්පත, උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, සියලු අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද සනාථ කිරීමේ ලේඛනවල ඡායාස්ථ පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2022.08.13 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කළ තනතුර සඳහන් කළ යුතුය.

*අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත සඳහන් යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ අදාළ ලේඛනවල ඡායාස්ථ පිටපත් ඇතුළත් කර නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති හෝ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් බඳවා ගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.*

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් සහ වෘත්තීය සංවර්ධන),**<br>
**ලංකා බැංකුව,**<br>
**26 වන මහල,**<br>
**ලංකා බැංකු චතුරස්‍රය,**<br>
**අංක 01, ලංකා බැංකු මාවත,**<br>
**කොළඹ 01.**

*ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් වහාම නුසුදුස්සකු කිරීමට හේතු වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ. සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවා ගැනීම කල් දැමීමේ / අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුවේ.*

ලංකා බැංකුව BOC ජාතියේ මහා පහන් ටැඹ

Source: www.boc.lk (2022.07.31)